**සණස සංවර්ධන බැංකුව පී එල් සී**

**25 වන වාර්ෂික මහා සභා රැස්වීම් වාර්තාව**

**දිනය** : 2022.05.30

**ස්ථානය** : "අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාව", සණස සංවර්ධන බැංකුව, නො.12,එඩ්මන්ටන් පාර, කිරුළපන, කොළඹ 06

**සහභාගිත්වය** : කොටස්හිමියන් 65 (ZOOM තාක්ෂණය ඔස්සේ සහභාගී වූ)

**01**. බැංකුවේ 25 වන වාර්ෂික මහා සභා රැස්වීමේ කටයුතු පෙ.ව.10.00 ට අතත්‍ය ක්‍රමයට (Online) ආරම්භ කරන ලද අතර, ආගම සිහි කිරීමෙන් අනතුරුව සමූපකාර ප්‍රතිඥාව කියවීම සිදු කරන ලදී.

**02**. සමස්ථ සණස ව්‍යාපාරයේ උන්නතිය වෙනුවෙන් කැපවුණු, මිය ගිය සමූපකාරිකයින් සහ සණස සංවර්ධන බැංකුවෙහි මිය ගිය අධ්‍යක්ෂවරුන් සිහි කරමින් විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කරන ලදී.

**03**. සණස සංවර්ධන බැංකුවෙහි සභාපතිතුමිය විසින් සභාව අමතා පැමිණ සිටි සියළු දෙනාම උණුසුම් ලෙස පිළිගනිමින් 25 වන වාර්ෂික මහා සභා රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

**04**. සමාගම් ලේකම් ටාමරිකා රොද්‍රිගු මහත්මිය විසින් රැස්වීම පිළිබඳ නිවේදනය කියවන ලදී.

**05**. පසුගිය වාර්ෂික මහා සභා රැස්වීම් වාර්තා සම්මත කිරීම.

2021.05.28 දින පැවති 24 වන වාර්ෂික මහා සභා රැස්වීම් වාර්තාව සහ අති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව කොටස්හිමියන් විසින් ඒකමතිකව සම්මත කරන ලදී.

**06**. බැංකුවේ සභාපතිතුමිය විසින් 2021 මූල්‍ය වර්ෂය පිළිබඳව කොටස්හිමියන් වෙත කෙටි පැහැදිලි කිරීමක් සිදු කරන ලදී.

**07. සාමාන්‍ය යෝජනා**

**7.1. 2021.12.31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා ලාභාලාභ ගිණුම, ශේෂ පත්‍රය, අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව හා විගණකවරුන්ගේ වාර්තාව සභා සම්මත කිරීම.**

2021.12.31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා බැංකුවෙහි විගණකවරුන් වන අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් සමාගමෙහි සාමාජිකයින් විසින් විගණන වාර්තාව සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

2021.12.31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභාලාභ ගිණුම, ශේෂ පත්‍රය, අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව හා විගණකවරුන්ගේ වාර්තාව කොටස්හිමියන් විසින් ඒකමතිකව සම්මත කරන ලදී.

**7.2. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්දේශ කල පරිදි සියලුම කොටස්හිමියන් සඳහා කොටසකට රු. 1.50 බැගින් අවසාන ලාභාංශයක් ප්‍රකාශයට පත් කිරීම සහ රැස්වීම් නිවේදනයේ සඳහන් සාමාන්‍ය යෝජනාව සම්මත කිරීම.**

2021.12.31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා නිර්දේශිත කොටසකට රු.1.50 බැගින් වූ අවසාන ලාභාංශයක් ලබා දීමේ යෝජනාව කොටස්හිමියන් විසින් ඒකමතිකව සම්මත කරන ලදී.

**7.3. අධ්‍යක්ෂවරුන් නැවත පත් කිරීම හෝ පත් කිරීම.**

25 වන වාර්ෂික මහා සභාවේදී අධ්‍යක්ෂවරුන් සිව්දෙනෙකු තෝරා පත් කර ගැනීම සඳහා කොටස්හිමියන් විසින් පහත නම් ඉදිරිපත් කර ඇති බව සමාගම් ලේකම් විසින් කොටස්හිමියන් වෙත දන්වා සිටින ලදී.

- සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි සාංගමික ව්‍යවස්ථාවේ 6(4)(i) වගන්තිය ප්‍රකාරව කාර්ය මාරු ක්‍රමයට 25 වන වාර්ෂික මහා සභා රැස්වීමේදී විශ්‍රාම යන සී/ස පොල්ගහවෙල සණස සමිති සංගමය නියෝජනය කරනු ලබන බී.ආර්.ඒ.බණ්ඩාර මහතා අධ්‍යක්ෂවරයකු වශයෙන් නැවත පත් කිරීම.

- සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි සාංගමික ව්‍යවස්ථාවේ 6(4)(i) වගන්තිය ප්‍රකාරව කාර්ය මාරු ක්‍රමයට 25 වන වාර්ෂික මහා සභා රැස්වීමේදී විශ්‍රාම යන කෝගෝල් සණස ෂෙයාර්හෝල්ඩර්ස් ට්‍රස්ට් කම්පනි ලිමිටඩ් නියෝජනය කරනු ලබන ජේ.ඒ. ලලිත් ජී.ජයසිංහ මහතා අධ්‍යක්ෂවරයකු වශයෙන් නැවත පත් කිරීම.

- සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනියම් පුරප්පාඩුවක් (Casual Vacancy) පිරවීම සඳහා පත් කරන ලද කොන්රඩ් ඩයස් මහතා, බැංකුවේ සාංගමික ව්‍යවස්ථාවේ 6(4)(ii) වගන්තිය ප්‍රකාරව 25 වන වාර්ෂික මහා සභා රැස්වීමේදී, සී/ස එල් ඕ එල් සී ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩිංග්ස් වන් (පුද්ගලික) සමාගම නියෝජනය කරමින් අධ්‍යක්ෂවරයකු ලෙස නැවත පත් කිරීම.

- සී/ස අනුගොඩ සණස සමිතිය නියෝජනය කරනු ලබන යූ.කේ.උපාලි විජේරත්න මහතා අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කිරීම.

- එලායන්ස් ෆිනෑන්ස් කම්පනි පී එල් සී නියෝජනය කරනු ලබන ආර්.කේ.ඊ.පී. ද සිල්වා මහතා අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කිරීම.

- සී/ස සෙන්තිල්වර්ල් හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම නියෝජනය කරනු ලබන සෙන්තිල්වර්ල් සෙන්දි ආදවන් මහතා අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කිරීම.

- එස්.නීලකන්දන් මහතා අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කිරීම.

**7.3.1. සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි සාංගමික ව්‍යවස්ථාවේ 6(4)(i) වගන්තිය ප්‍රකාරව කාර්ය මාරු ක්‍රමයට 25 වන වාර්ෂික මහා සභා රැස්වීමේදී විශ්‍රාම යන සී/ස පොල්ගහවෙල සණස සමිති සංගමය නියෝජනය කරනු ලබන බී.ආර්.ඒ.බණ්ඩාර මහතා අධ්‍යක්ෂවරයකු වශයෙන් නැවත පත් කිරීම.**

බී.ආර්.ඒ.බණ්ඩාර මහතා ඡන්ද 84,511,579 (96%) ක් ලබා ගනිමින් බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා නැවතත් තේරී පත් වූ බව බැංකුවෙහි සමාගම් ලේකම් විසින් කොටස්හිමියන් වෙත දන්වා සිටින ලදී.

තවද බී.ආර්.ඒ.බණ්ඩාර මහතා අධ්‍යක්ෂවරයෙකු වශයෙන් නැවත පත් කිරීමේ යෝජනාව කොටස්හිමියන් විසින් ඒකමතිකව සම්මත කරන ලදී.

**7.3.2. සී/ස සෙන්තිල්වර්ල් හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම නියෝජනය කරනු ලබන සෙන්තිල්වර්ල් සෙන්දි ආදවන් මහතා අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කිරීම.**

සෙන්තිල්වර්ල් සෙන්දි ආදවන් මහතා ඡන්ද 77,562,526 (88%) ක් ලබා ගනිමින් බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා තේරී පත් වූ බව බැංකුවෙහි සමාගම් ලේකම් විසින් කොටස්හිමියන් වෙත දන්වා සිටින ලදී.

තවද සෙන්තිල්වර්ල් සෙන්දි ආදවන් මහතා අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත් කිරීමේ යෝජනාව කොටස්හිමියන් විසින් ඒකමතිකව සම්මත කරන ලදී.

**7.3.3.එලායන්ස් ෆිනෑන්ස් කම්පනි පී එල් සී නියෝජනය කරනු ලබන ආර්.කේ.ඊ.පී. ද සිල්වා මහතා අධ්‍යක්ෂවරයකු වශයෙන් පත් කිරීම.**

ආර්.කේ.ඊ.පී. ද සිල්වා මහතා ඡන්ද 73,716,910 (84%) ක් ලබා ගනිමින් බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා තේරී පත් වූ බව බැංකුවෙහි සමාගම් ලේකම් විසින් කොටස්හිමියන් වෙත දන්වා සිටින ලදී.

තවද ආර්.කේ.ඊ.පී. ද සිල්වා මහතා අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත් කිරීමේ යෝජනාව කොටස්හිමියන් විසින් ඒකමතිකව සම්මත කරන ලදී.

**7.3.4. සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනියම් පුරප්පාඩුවක් (Casual Vacancy) පිරවීම සඳහා පත් කරන ලද කොන්රඩ් ඩයස් මහතා, බැංකුවේ සාංගමික ව්‍යවස්ථාවේ 6(4)(ii) වගන්තිය ප්‍රකාරව 25 වන වාර්ෂික මහා සභා රැස්වීමේදී, සී/ස එල් ඕ එල් සී ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩිංග්ස් වන් (පුද්ගලික) සමාගම නියෝජනය කරමින් අධ්‍යක්ෂවරයකු ලෙස නැවත පත් කිරීම.**

කොන්රඩ් ඩයස් මහතා ඡන්ද 71,986,825 (82%) ක් ලබා ගනිමින් බැංකුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා නැවතත් තේරී පත් වූ බව බැංකුවෙහි සමාගම් ලේකම් විසින් කොටස්හිමියන් වෙත දන්වා සිටින ලදී.

තවද කොන්රඩ් ඩයස් මහතා අධ්‍යක්ෂවරයෙකු වශයෙන් නැවත පත් කිරීමේ යෝජනාව කොටස්හිමියන් විසින් ඒකමතිකව සම්මත කරන ලදී.

**7.4. 2022 වර්ෂය සඳහා විගණකවරුන් වශයෙන් අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් වරලත් ගණකාධිකාරී ආයතනය තෝරා පත් කර ගැනීම සහ ඔවුන්ගේ පාරිශ්‍රමිකයන් තීරණය කිරීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය වෙත බලය පැවරීම.**

2022 වර්ෂය සඳහා බැංකුවෙහි විගණකවරුන් වශයෙන් අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් සමාගම නැවත පත් කිරීම සලකා බැලීම සහ ඔවුන්ගේ පාරිශ්‍රමිකයන් තීරණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට බලය පැවරීම සම්බන්ධ යෝජනාව කොටස්හිමියන් විසින් ඒකමතිකව සම්මත කරන ලදී.

**7.5. 2022 වර්ෂය සඳහා ප්‍රදානයන් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත බලය පැවරීම.**

2022 වර්ෂය සඳහා ප්‍රදානයන් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත බලය පැවරීම සම්බන්ධ යෝජනාව කොටස්හිමියන් විසින් ඒකමතිකව සම්මත කරන ලදී.

**08. කොටස්හිමියන්ගේ විමසීම්**

කොටස්හිමියන් විසින් කිසිදු ගැටළුවක් ඉදිරිපත් නොකරන ලදී.

**09. ස්තූතිය හා සමාප්තිය**

රටේ පවත්නා වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද මෙම වාර්ෂික මහා සභා රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් සියලු දෙනා හට ස්තූතිය ප්‍රකාශ කරමින් සභාපතිතුමිය විසින් සිදු කල කතාවෙන් අනතුරුව මෙම 25 වන වාර්ෂික මහා සභා රැස්වීමේ සියළු වැඩ කටයුතු පෙරවරු 11.00 ට පමණ සමාප්ත විය.

ටාමරිකා රොද්‍රිගු

සමාගම් ලේකම්

2022.05.30